# පාට පාට සමනලයා



මින්දිනී දෙහන්සා චන්සිළුණී සුභසිංහ

# පාට පාට සමනලයා

## මින්දිනී දෙහන්සා වන්සිළුණි සුභසිංහ

## කතෘගේ වෙනත් කෘති

කම්මැලි සිහිනි
හොඳ යාළුවෝ
සැබෑ වූ සිහිනය

මහ/මහමායා බාලිකා විද්‍යාලය
7 ශ්‍රේණිය A
ISBN 978-624-211-131-5

# ප්‍රදීම

සිප්සතර කියාදුන් මා දයාබර
ගුරුමෑණිවරුන්ටත් පියවරුන්ටත්
මෙම පොත පුදකරමි

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා  එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප් රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාරයක් දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බලිකා විද්

යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ ආරම්භ කර ඇති හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වුණු ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යය කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත්වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතු වීම ඉතා ප්‍රසංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරි නමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්.අභයකෝන්,

ආණ්ඩුකාරවර මධ්‍යම පළාත ,

සම්මානිත මහාචාර්ය පේරාදෙණිය විශ්ව විද්‍යාලය

2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතිය සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව් යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ප්‍රදීප් නිලංග දැල,**
**දියවඩන නිලමේ,**
**ශ්‍රී දළදා මාලිගාව**
**2026.05.1**

## පාට පාට සමනලයා

පුංචි නෙතු ඉගෙනීමට දක්ෂ මෙන්ම කීකරු ළමයෙකි. නෙතූගේ විනෝදාංශය වූයේ මල් වැවීමයි.

පුංචි නෙතු අම්මත් සමඟ එකතු වී ලස්සන මල් වත්තක් හදා ගත්තා. නෙතුගේ මල් වත්තේ පාට පාට මල් පිපිලා හරිම ලස්සනයි.

නෙතු හැමදාම උදෙන්ම අවදි වෙලා දුවගෙන යන්නේ මල් වත්තට. දැන් නෙතුට හරිම සතුටුයි.

"අම්මේ මෙ බලන්නකෝ... මගේ මල් වත්තේ ලස්සන ලස්සන මල් පිපිලා." පාට පාට සමනල්ලු, මීමැස්සෝ පිරිලා. හරිම ලස්සනයි කියලා සතුටින් සෙල්ලම් කරනවා.



එක දවසක් උදෙන්ම අවදි වෙලා මල් වත්තට දූවගෙන ගිය නෙතු,

"අනේ අම්මේ දූවගෙන එන්නකෝ..." කියලා කෑ ගහන්න පටන් ගත්තා.
අම්මා දූවගෙන ආවා.

"මේ බලන්නකෝ අම්මේ මගේ මේ ලස්සන රෝස පැළය හා මල් ඔක්කොම කාලානේ අම්මේ." කියලා අඬන්න පටන් ගත්තා.

"අඬන්න එපා දූවේ. මේ බලන්නකෝ මේ රෝස පඳුරේ ගහේ පණුවෝ ගොඩාක් ඉන්නවා. එයාලා වෙන්න රෝස පඳුර සහ මල් කන්න ඇත්තේ. අපි එයාලව අයින් කරලා දාමු." අම්මා කිව්වා.



මේ කතාව අහගෙන හිටිය එක පණු පැටියෙක් හරිම බයෙන් රෝස පඳුරේ කොළ දෙකක් එකිනෙක එකතු කරගෙන හැංගුණා. අම්මා සහ නෙතු පණුවන් එකතු කර ගෙන ඈතට ගෙනියන දිහා පණු පැටියා දුකෙන් බලාගෙන හිටියා.

පණු පැටියාට දැන් එයාගේ යාලුවෝ කවුරුත් නැහැ. එයාට කොළයෙන් එළියට එන්න විදිහකුත් නැහැ. කොළ දෙක ඇතුලටම වෙලා දුකෙන් බලාගෙන හිටියා.

නෙතු හැමදාම උදෙන්ම මල් වත්තට ඇවිත් පාට පාට සමනලුන් එක්ක සෙල්ලම් කරන ආකාරය පණු පුංචා දැක්කා. කොළ දෙක අතරේ සැඟවී සිටින පණු පැටියා මෙහෙම හිතුවා.



"අනේ මටත් ලස්සන පාට පාට අත්තටු දෙකක් තිබුණා නම් නෙතු සමඟ සෙල්ලම් කරන්න තිබුණානේ."

ටික දවසක් යන විට පණුවාට මේ කොළ දෙක අතරේ සැඟවී ඉන්නත් බැරිව ගියා.

එයාට අමුතු වෙනසක් දැනුනා. පණු පැටියා සෙමින් කොළ දෙක අතරින් එළියට ආවා.

"මට හරි ම වෙනසක් දැනෙනවා. අත්තටු දෙකක් තියෙනවා කියලා" සෙමින් සෙමෙන් අත්තටු දෙක සොලවන්න පටන් ගත්තා. ඊට පස්සේ සෙමින් පියාඹන්න පටන් ගත්තා.



"මට දැන් පියාඹන්න පුළුවන්." කියා සතුටින් පියඹමින් මලින් මලට ගොස් පැණි බීවා.

එදා උදෙන්ම අවදි වූ නෙතූ සතුටින් දුවගෙන ගියේ එයාගේ මල්වත්තට පාට පාට ලස්සන සමනලයින් දැකලා. ඒ අතරේ සිටි අමුතු ලස්සනක් සහිත සමනල් පැටියා දැකලා සතුටින් කෑ ගැසුවා.

"අම්මේ අද මගේ මල් වත්තේ මල් පැණි බොන්න ලස්සන පාට පාට සමනල් පැටියෙකුත් ඇවිත්නේ."



"මේ බලන්නකෝ,

පාට පාට පිහාටු ඇති පුංචි පුංචි සමනලයෝ
පියඹාලා මලින් මලට යනවද පොඩි සමනලයෝ
යාළුකමට මල් මොකටද මම නරකද සමනලයෝ
පියාඹලා මගේ අතට එනවද පොඩි සමනලයෝ

කියමින් නටන නෙතුව දැකලා සමනලයාට හරිම සතුටක් දැනුනා.

ළමයින් ආසාවෙන් බලා ගන්නා මල් පැළ හා මල් විනාශ කරන පණුවන්ට වඩා පාට පාට පුංචි සමනලයින්ට කොයි තරම් ආදරෙයිද කියලා සිතූ සමනල් පැටියා නෙතූ සමඟ සතුටින් සෙල්ලම් කළා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප් රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කා ර් ය මණ්ඩලයටද මෙම සද්කාර් ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනවිරත්න මහලේබම්

**(ව්‍යාපෘති නිර්මාතෘ)**